“Economic Steadiness Anchors Bond Yield Curve Stability”

FIRST CAPITAL FIXED INCOME RECOMMENDATION | 28 Oct 2025

FIRST CAPITAL RESEARCH

Analysts:
Ranjan Ranatunga
ranjan@firstcapital.lk

Dimantha Mathew
dimantha@firstcapital.lk

First Capital
A Janashakthi Group Company

1.0
FCR - පූර්ව නිර්දේශය

“ඉදිරි මාස 6 – 12ක කාලය තුළ ප්‍රතිලාභ ස්ථාවරව පවතිනු ඇත.”

ඉදිරි මාස 6 – 12 කාලය තුළ ප්‍රතිලාභ ස්ථාවරව පවතිනු ඇත

පෙර නිර්දේශ

First Capital
A Janashakthi Group Company



10Yr — Dec-24 to date **-78 bps**

5Yr — Dec-24 to date **-93 bps**

1Yr — Dec-24 to date **-85 bps**

2025 ජනවාරි 16

"ආර්ථික වර්ධනය වේගවත් වන විට 2025 දෙවන කාර්තුවේ සිට G-Sec ප්‍රතිලාභ c.100-150bps දක්වා ඉහළ යාමේ පීඩනයක් අත්විඳීමට ඉඩ ඇත."

- සාවද්‍යයි

2025 මාර්තු 28

"ප්‍රතිලාභ වක්‍රයේ ඉහළට ගැලපීම පිළිබඳ අපේක්ෂාව 2025E Q4 දක්වා ප්‍රමාද වේ."

- නිවැරදියි

2025 ජූලි 14

"ඉදිරි මාස 6 – 12 දක්වා කාලය තුළ ප්‍රතිලාභ ස්ථාවර ව පවතිනු ඇත වර්ධනය කළ හැකි කළඹක් පවත්වා ගෙන යාමේ අරමුණින් කාලීන කාල සීමා වෙත මාරු වීම දක්නට ලැබිණි."

- නිවැරදියි

2025 වසරේ මාස 9ක් තුළ වෙළෙඳපොළ වෙනස් වීම් පිළිබඳ සමාලෝචනය

2025 මාස 9 ක කාලය තුළ සාරාංශය :

“වර්ධනය කළ හැකි කළඹක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කෙටි කාලීන කාල සීමාවන් වෙත මාරු වීම”

2025 වසරේ පළමු භාගය තුළ ප්‍රතිලාභ වක්‍රය ඉහළ පහළ යාමේ තත්ත්වයක් නිර්මාණය වූ අතර, සමස්ත ප්‍රතිලාභ 100bps කින් පමණ පහත වැටුණි. ප්‍රතිලාභ වක්‍රයේ පහත වැටීමට බැංකු අංශයේ අතිරික්ත ද්‍රවශීලතාවේ වැඩි වීම (2025 මැයි 30 වන දින රුපියල් බිලියන 203.8 ට ළඟා වීම) සහ 2025 මැයි ප්‍රතිපත්ති රැස්වීමේ දී ප්‍රතිපත්ති අනුපාත තව දුරටත් 25bps කින් ලිහිල් කිරීම බොහෝ දුරට හේතු විය.

කෙසේ වෙතත්, 2025 තුන් වන කාර්තුව තුළ ප්‍රතිලාභ වක්‍රයේ පහත වැටීමේ ප්‍රවණතාව මඟහැරුණු අතර, වසර 1, වසර 5 සහ වසර 10 පරිණත වීමේ කාල පරාස සඳහා ප්‍රතිලාභ පිළිවෙලින් 12bps, 5bps සහ 27bps කින් ඉහළ ගියේය. නිල සංචිත තත්ත්වයේ මන්දගාමී වර්ධනය, උද්ධමනය ධනාත්මක ව කළමනාකරණය කර ගත හැකි වීම, පෞද්ගලික අංශයේ ණය සැලකිය යුතු ලෙස ඉහළ යාම ප්‍රතිලාභ සුළු වශයෙන් වර්ධනය වීමට හේතු ලෙස හඳුනා ගෙන ඇත. වසර මැද දැක්ම තුළින් ඉදිරිපත් කළ පරිදි ප්‍රතිලාභ ස්ථාවරව පැවතීම හරහා අපගේ මඟ පෙන්වීමේ නිවැරදි බව සනාථ විය.

සමස්ත ප්‍රතිලාභ වක්‍ර චලනය

First Capital
A Janashakthi Group Company

මාසය අවසානයේ ප්‍රතිලාභ වක්‍රය සංසන්දනය



පොලී අනුපාත වෙනස (bps)

කාලය	2025 සැප්තැම්බර්	2025 ජූලි	වෙනස (bps)	2024 දෙසැම්බර්	වෙනස (bps)
3M	7.65%	7.50%	+15	8.60%	-95
6M	7.95%	7.68%	+27	8.75%	-80
1 Yr	8.05%	7.93%	+12	8.90%	-85
2 Yrs	8.80%	8.40%	+40	9.10%	-30
3 Yrs	9.30%	8.85%	+45	9.90%	-60
4 Yrs	9.73%	9.35%	+38	10.50%	-77
5 Yrs	9.80%	9.65%	+15	10.73%	-93
6 Yrs	10.10%	9.95%	+15	10.95%	-85
7 Yrs	10.55%	10.35%	+20	11.35%	-80
8 Yrs	10.70%	10.60%	+10	11.50%	-80
9 Yrs	10.80%	10.60%	+20	11.53%	-73
10 Yrs	10.85%	10.63%	+22	11.63%	-78
12 Yrs	N/A	N/A	N/A	N/A	N/A
15 Yrs	N/A	N/A	N/A	N/A	N/A
20 Yrs	N/A	N/A	N/A	N/A	N/A

2.0

ස්ථාවර ආදායම් සඳහා ඉදිරි දැක්ම

“ආර්ථික දර්ශක ආශ්‍රිත ව ස්ථාවර ප්‍රකෘතිමත් වීමක් පෙන්නුම් කරයි”

ආර්ථික දර්ශකවල ස්ථාවරත්වය පවත්වා ගෙන යනු ලැබේ.

රජයේ සුරැකුම්පත් ස්ථාවරව පවතී



පොලී අනුපාත ස්ථාවරව පවතී



ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 3.4% (YTD) කින් අවප්‍රමාණය වේ.



2025 වසරේ මාස 11 කට පසු උද්ධමනය ධනාත්මක තත්ත්වයකට



පෞද්ගලික අංශයේ ණය වර්ධනය 13.8% (YTD) කින් ඉහළට



සංචිත ඇමරිකානු ඩොලර් බිලියන 6.2 ක් ලෙස ස්ථාවර ව පවතී.



උද්ධමනය තවදුරටත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉලක්කයට වඩා පහළින් පවතින අතර ...

2025 අගෝස්තු මාසය දක්වා අඛණ්ඩව මාස 11 ක් CCPI උද්ධමනය ධනාත්මක වූ අතර, ඊට 2024 වසරේ දී ඇති වූ විවිධ බලපෑම් හේතු විය. 2025 සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය 1.5% කින්(YOY) ඉහළ ගිය අතර, 2025 අගෝස්තු මාසයේ දී 2.0%ක් ලෙස වාර්තා වූ ආහාර මිල ගණන් 2025 සැප්තැම්බර් මාසයේ දී 2.9% දක්වා සුළු වශයෙන් ඉහළ යාම සිදු විය. එමෙන් ම 2025 අගෝස්තු මාසයේ දී 8.0%ක් ලෙස වාර්තා වූ ආහාර නොවන උද්ධමනය 2025 සැප්තැම්බර් මාසයේ දී 0.7% දක්වා සුළු වශයෙන් අඩු විය. ඉදිරිය දෙස බලන විට, ආර්ථිකයේ මන්දගාමී බව හේතුවෙන් 2025 වසරේ ඉතිරි කලය සහ 2026 වසර තුළ උද්ධමනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂිත සීමාවට වඩා පහළින් පවතිනු ඇතැයි පුරෝකථනය කළ කැකි ය.



Source: Dept. Census and Statistics, First Capital Research



Source: Dept. Census and Statistics, First Capital Research

... සංචිත වර්ධනය වීම මන්දගාමී ව පැවතුණද ...

2025 මාර්තු මාසය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන 6.5 ක් වූ අතර, එය සැප්තැම්බර් 20 වන දින සිට ඉහළ ම අගය වූ ඇමරිකානු ඩොලර් බිලියන 6.6 ක් ලෙස වාර්තා විය. කෙසේ වෙතත්, මේ දක්වා සංචිත ගොඩනැඟීමේ ක්‍රියාවලිය මන්දගාමී වී ඇත්තේ 2025 මාර්තු මාසය වන තෙක් පිළිවෙළින් ඇමරිකානු ඩොලර් මිලියන 900.0 ක් සහ ඇමරිකානු ඩොලර් මිලියන 209.0 ක් වූ ඉන්දීය සංචිත බැංකුවට සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පියවීම හේතුවෙනි.එම ණය පියවීම් සහ වාහන ආනයනය කිරීම සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 1.5 ක් (අගෝස්තු මාසය අවසානය වන විට ඇමරිකානු ඩොලර් බිලියන 1.5 ක්) යෙදවීම 2025 මාර්තු සිට සංචිත වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් බාධාවක් ලෙස බල පෑ බව අපි විශ්වාස කරමු. 2025 වසර සඳහා FCR පුරෝකථනය ඇමරිකානු ඩොලර් බිලියන 7.0 ක් ලෙසත් 2025 වසර සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුරෝකථනය ඇමරිකානු ඩොලර් බිලියන 7.2 ක් ලෙසත් ඉදිරිපත් කර ඇති බැවින්, ඉදිරි සීමිත කාලය සහ සංචිත ඉහළ නැංවිය හැකි ආයෝජන සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකාවේ සංචිත සඳහන් කළ ඉලක්කවලට වඩා අඩු වනු ඇතැයි විශ්වාස කරමු.



... පළමු මාස අට සඳහා ජංගම ගිණුම් අතිරික්තය ඉහළ ගොස් ඇත.

ආනයන අත්හිටුවීම ඉවත් කළ ද , ආර්ථික අර්බුදයෙන් පසු ව ශ්‍රී ලංකාවේ බාහිර තත්ත්වය අඛණ්ඩව වැඩිදියුණු වෙමින් පවතී. පුළුල් වූ වෙළෙඳ හිඟය, සංචාරක ව්‍යාපාරයෙන් සහ ප්‍රේෂණවලින් ලැබෙන ආදායම වර්ධනය වීම නිසා බොහෝ දුරට පියවා ගැනීමට හැකි වූ අතර, බහුපාර්ශ්වක ආයෝජන ද ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපෑවේය. වාහන ආනයන සඳහා ඇති ඉල්ලුම අඩ වීම සහ වර්ධනය වන විදේශ ප්‍රේෂණ හා සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත අඛණ්ඩ ප්‍රතිලාභ නිසා 2025 සහ 2026 යන වසරවල දී ශ්‍රී ලංකාවේ ජංගම ගිණුම තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2025 අගෝස්තු මාසයේ දී ජංගම ගිණුමේ අතිරික්තය ඇමරිකානු ඩොලර් 368 ක වර්ධනයක්



කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව ඇමරිකානු ඩොලර් සංචිත එක් රැස් කිරීම වෙනුවෙන් ඇමරිකානු ඩොලර් මිල දී ගැනීම අඛණ්ඩ ව කර ගෙන යයි...

ශ්‍රී ලංකා මහ බැංකුව, දේශීය වෙළෙඳපොළෙන් ඇමරිකානු ඩොලර් මිල දී ගන්නා ප්‍රධානතම ගැනුම් කරුවෙකු ලෙස අඛණ්ඩ ව 14 වන මාසයටත් වෙළෙඳපොළ විකුණුම් අවශ්‍යතාවට වඩා වැඩියෙන් ඇමරිකානු ඩොලර් මිල දී ගැනීම සිදු කළ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව 2025 සැප්තැම්බර් දක්වා දේශීය වෙළෙඳපොළෙන් ඇමරිකානු ඩොලර් බිලියන 1.4 ක ශුද්ධ මිල දී ගැනීම සිදු කර ඇත. ශ්‍රී ලංකාවේ බාහිර ගිණුම ආශ්‍රිත ව අඛණ්ඩ ව ජංගම ගිණුම් අතිරික්තයක් වාර්තා වන අතර, එම නිසා ඇමරිකානු ඩොලර් මිල දී ගැනීම් ඉදිරියටත් කරගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ.



... ද්‍රවශීලතාව නැවතත් පෙර පැවති උච්චතම මට්ටම් කරා ගෙන යාමට සහාය වේ.

අපගේ අනුමානයන්ට අනුකූලව, බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව අගෝස්තු 25 වන දින වන විට පැවත අවදානම් සහගත අවම මට්ටම ඉක්මවමින් වර්ධනය වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩ ව ඇමරිකානු ඩොලර් මිල දී ගැනීම, ශ්‍රී ලංකා මහ බැංකු කොටස්වල ආයෝජනය කිරීම තාවකාලිකව අත්හිටුවීම සහ රාජ්‍ය ආයතන විසින් බදු එකතු කිරීම වැඩි වීම ද්‍රවශීලතා තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීමට උපකාරී වූ අතර, වාහන ආනයනය නිසා ණය ඉල්ලුම වැඩි වීම ප්‍රකෘතිමත් වීම අර්ධ වශයෙන් මන්දගාමී වීමට හේතු විය.



ණය ඉල්ලුම වැඩි වුවද...

පෞද්ගලික ණය ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් සමස්තණය ුම වර්ධනය වූ අතර රජයට ණය ලැබීම පසුගාමී විය.



FCR expects this trend to persist with credit to GDP hovering around 50% and private sector credit growth nearing 15% in 2025E



... රජය අඛණ්ඩ ව දැඩි ස්ථාවරයක සිටින අතර, ...

2023 වසර දක්වා ප්‍රාථමික අතිරික්තයන් පවත්වා ගැනීම සඳහා රජය බොහෝ දුරට ස්ථාවර වී ඇති අතර, IMF කොන්දේසිවලට අනුකූලව පවතී. 2025E සහ 2026E යන වසරවල දී ද මෙම ප්‍රවණතාවය පවත්වා ගැනීමට FCR අපේක්ෂා කරන අතර, 2024 දී 2.2% ක් වූ ප්‍රාථමික අතිරික්තය 2025E දී 2.3% (දළ දේශීය නිෂ්පාදිතයෙන්) දක්වා ළඟා වේ.

ප්‍රාථමික අතිරික්තය අඛණ්ඩව දෙවන කාර්තුව සඳහාත් ධනාත්මක ව ක්‍රියාත්මක වේ.



ප්‍රාථමික ශේෂය (දළ දේශීය නිෂ්පාදිතයෙන් %) අඛණ්ඩව ධනාත්මක අයුරින් පැවතීම නිසා භාණ්ඩාගාරයේ බර අඩු වේ.



Source: CBSL, First Capital Research

... වැඩි වූ ආදායම සහ සීමිත වියදම් මගින් ලබා දෙන සහයෝගයෙන් ...

ශ්‍රී ලංකාව 2023 වසර දක්වා දැඩි මූල්‍ය විනයක් පවත්වා ගෙන ගොස් ඇත. විශේෂයෙන් 2023 මාර්තු මාසයේ IMF ක්‍රියාත්මක කරන EFF වැඩසටහනට ඇතුළත් වීමෙන් අනතුරු ව සිදු කෙරුණු බදු ප්‍රතිසංස්කරණ හේතුවෙන් ආදායම වර්ධනය වී ඇති අතර, ප්‍රාග්ධන වියදම් අඩු වීම, වියදම් පාලනයට බලපා ඇත. 2025 වසරේ දී ආදායම සහ වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් 15.5% ක් සහ 21.4% ක් දක්වා ප්‍රතිශතයකට ළඟා වනු ඇතැයි First Capital පර්යේෂණ අංශය අපේක්ෂා කරයි, එය බොහෝ දුරට IMF කොන්දේසිවලට සමපාත වේ.

2025 පළමු අර්ධයේ දී බදු ආදායම 26% කින් සහ වියදම් 12% කින් ඉහළ ගිය අතර, ප්‍රාග්ධන වියදම් 20% කින් පහත වැටීමෙන් එය පාලනය විය.



Government to stay within IMF fiscal parameters



Source: ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය, First Capital

...ධනාත්මක භාණ්ඩාගාර අතිරික්තයක් පවත්වා ගැනීමට රජයට හැකියාව ලබාදේ....

2023 වසරේ අග භාගයේ සිට මේ දක්වා රට තුළ දක්නට ලැබෙන භාණ්ඩාගාරයේ මුදල් අතිරික්තයට ශ්‍රී ලංකා රජය අඛණ්ඩව පවත්වා ගෙන යන ප්‍රාථමික අතිරික්තයන් හේතු වී ඇත.

පුරෝකථනය කරන ලද මුදල් අතිරික්තය රු. ට්‍රිලියන 1.0 ක් පමණ වනු ඇත.



සටහන: අප්‍රේල්-25 සංඛ්‍යාලේඛන First Capital පර්යේෂණ පුරෝකථන වේ.

- භාණ්ඩාගාරයේ මුදල් අතිරික්තය
- ප්‍රමුඛතම ධාවකයන්

- රජයේ ප්‍රාථමික අතිරික්තය...
- බහුපාර්ශ්වික ආදායම්...

Source:** ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය, **First Capital

...කල්පිරීම් පිළිබඳ අපේක්ෂාවෙන් සිටිය ද, වෙන්දේසි කිරීම් අනුමත කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට ඇති පීඩනය අඩු කිරීම..

භාණ්ඩාගාරයේ මුදල් අතිරික්තය නිසා බිල්පත් සහ බැඳුම්කර වෙන්දේසිවල දී ඇතැම් ලංසු ප්‍රතික්ෂේප කිරීමට බලධාරීන්ට හැකි වී ඇති අතර, එමඟින් පොලී අනුපාත ආශ්‍රිත ව ප්‍රශස්ත පාලනයක් ක්‍රියාත්මක වේ.



බොහෝ විට බිල්පත් සහ බැඳුම්කර වෙන්දේසිවල දී ලංසු ප්‍රතික්ෂේප වීමේ ප්‍රතිඵලයක් ලෙස කල්පිරීම්, නව නිකුතු ඉක්මවා යාම සිදු වේ. මූල්‍ය බලධාරීන්ට මෙය කිරීමට හැකියාව ලබා දී ඇත්තේ භාණ්ඩාගාරයේ මුදල් අතිරික්තය හේතුවෙනි.

3.0
ස්ථාවර ආදායම් පිළිබඳ ලකුණු

“වර්ධනය මන්දගාමී වීමේ සලකුණු පෙන්නුම් කරයි”

FI Economic Health Score: Jul-25 - Sep-25

2025 ජූනි මාසයේ සිදු කෙරුණු අපගේ අවසන් යාවත්කාලීන කිරීමේ සිට, වර්ධනීය ලකුණු බොහෝ දුරට අස්ථාවර වී ඇති අතර, ලකුණු 69-72 අතර රැඳී තිබේ. වර්ධනීය ලකුණු වටා ඇති අස්ථාවරත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ උද්ධමනය වර්ධනය වීම සහ බැංකු ක්ෂේත්‍රයේ පවතින ද්‍රවශීලතා අස්ථාවරත්වයයි.

ප්‍රාථමික නිර්ණායක	-	54	- 02	=	52
ද්විතියික නිර්ණායක	-	19	+ 00	=	19
ආර්ථික වර්ධන ලකුණු [2025 මාර්තු]				=	71

[2025 ජූනි වාර්තා කළ 72 ට සහ 2024 සැප්තැම්බර් වාර්තා කළ 68ට සාපේක්ෂ ව(වසරකට පසු)]

2025 ජූනි - 2025 සැප්තැම්බර් වර්ධනීය ලකුණුවල වෙනස්කම් ආශ්‍රිත ප්‍රාථමික නිර්ණායක

52/75

Previous score 11/15

Foreign Reserves

Foreign reserves grew marginally during Sep-25 to USD 6.2Bn from USD 6.1Bn in Aug-25. However, reserves continue to remain below the peak of USD 6.5Bn recorded in Mar-25

11/15

12/15

Liquidity

Since falling near LKR 50.0Bn in Jul-25, liquidity in the banking system bounced back up in-line with our expectations and currently hovers around LKR 169.1Bn in Oct-25.

12/15

13/15

Inflation

After 11 months of deflation, inflation bounced back to positive 1.2% in Aug-25 and grew further to 1.5% in Sep-25, as both food and non-food prices picked up.

15/15

-2

Previous score 01/10

Foreign Activity

Foreign investments in government securities continued to improve slowly and recorded at LKR 130.3Bn. However, this continues to remain below the CBSL threshold of 5%.

01/10

05/10

Credit

Credit to the private sector continued to expand in Aug-25 recording LKR 226.8Bn in Aug-25 and a YTD growth of 13.8%.

05/10

10/10

CBSL Holdings

CBSL holdings remained unchanged since Jun-25 at LKR 2.5Tn. .

10/10

2025 ජූනි - 2025 සැප්තැම්බර් දක්වා වර්ධනීය ලකුණු වල වෙනස්කම් ආශ්‍රිත ද්විතියික නිර්ණායක

19/25

First Capital

	Previous score	
ශ්‍රේණිගත කිරීම් ස්ථාවර ඉදිරි දැක්ම සහ ආර්ථික දර්ශකවල ප්‍රකෘතිමත් වීම හේතුවෙන්, S&P ආයතනය විසින් ශ්‍රී ලංකාව සඳහා ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම CCC+ දක්වා සංශෝධනය කෙරිණි. මේ සමඟ ශ්‍රේණිගත කිරීමේ ආයතන තුනම ශ්‍රී ලංකාව සඳහා ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම පෙර SD ශ්‍රේණිගත කිරීමට වඩා සංශෝධනය කර ඇත.	02/05	02/05
බාහිර පරිසරය ධනාත්මක ජංගම ගිණුම් අතිරික්තයක් තිබිය දීත්, 2025 ඔක්තෝබර් වන විට වසා දැමූ රු. 304.0/USD ට සාපේක්ෂව රු. 3.4% YTD අවප්‍රමාණය විය.	03/05	03/05
BOT සහ BOP ආනයන අත් හිටුවීම ලිහිල් කිරීමත් සමඟ, පළමු මාස 8 සඳහා වෙළෙඳ හිඟය වසරින් වසර 19.6% කින් වැඩි වී ඇමරිකානු ඩොලර් බිලියන 4.3 ක් විය. කෙසේ වෙතත්, සංචාරක ක්ෂේත්‍රය සහ ප්‍රේෂණවල සහාය ඇතිව, ජංගම ගිණුම අඛණ්ඩව ශක්තිමත් වූ අතර, 2025 ජනවාරි-අගෝස්තු සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 2.0 ක් වාර්තා කළේය.	04/05	04/05

	Previous score	
දේශපාලනික අවදානම 2025 මැයි වන දින පවත්වන ලද පළාත් පාලන මැතිවරණයෙන් පාලක පක්ෂය බහුතරය ලබා ගැනීමත් සමඟ 2025 වසරේ දී දේශපාලන ස්ථාවරත්වය තවදුරටත් වැඩිදියුණු විය..	05/05	05/05
ආයෝජක විශ්වාසය 2025 ජූනි 25 වන විට ව්‍යාපාර විශ්වසනීය දර්ශකය සර්ව කාලීන ඉහළම අගය වන 210 ක් වාර්තා කළේය. කෙසේ වෙතත්, එතැන් සිට, ගෝලීය වශයෙන් මෑත කාලීන වර්ධනයන් සමඟ, BCI දර්ශකය 2025 අගෝස්තු වන දින සුළු ලකුණු 192 දක්වා පහත වැටිණි.	05/05	05/05

2026 වසරේ මැද භාගය වන විට මූල්‍ය ආයතනවල වර්ධනය සුළු වශයෙන් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- 2024 දෙසැම්බර් වන විට ලකුණු 78 ක උපරිමයකට ළඟා වූ අතර, වර්ධනීය ලකුණු කරා යොමු වන ආර්ථික දර්ශක සෙමින් පිරිහී ගොස් ඇත. එමෙන් ම ණය සඳහා වැඩි වන ඉල්ලුම, සංචිත පහත වැටීම සහ වෙළෙඳ හිඟය පුළුල් වීම මෙයට බොහෝ දුරට හේතු විය.

- ඉදිරියට යන විට, පෞද්ගලික අංශයෙන් ණය සඳහා ඇති ඉල්ලුම වැඩි වීම සහ බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව පහත වැටීම හේතුවෙන් මූල්‍ය ආයතන වර්ධනීය ලකුණු තවදුරටත් පහත වැටෙනු ඇතැයි අපි අපේක්ෂා කෙරේ. මෙය වර්ධනීය ලකුණු සුළු වශයෙන් පහත වැටීමට සහ පොලී අනුපාත මත යම් පීඩනයක් එක් කිරීමට හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- *කෙසේ වෙතත්, මූල්‍ය ආයතනවල වර්ධනීය ලකුණු, පොලී අනුපාත ආශ්‍රිත පීඩනයට සීමිත බලපෑමක් ඇති කරමින් අඩු අවදානම් තත්ත්වයක අඛණ්ඩ ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.*



4.0
නිර්දේශය සාර්ථකව ක්‍රියාත්මකයි

“රගෙන යා හැකි කළඹක් පවත්වා ගන්න”

OPR ස්ථාවර ව පවතිනු ඇත. ආර්ථිකය වේගවත් කිරීම සඳහා 25bps කප්පාදුවක් සිදු විය හැකි ය.



2025 සැප්තැම්බර් 23 වන දින පැවති 5 වන මුදල් ප්‍රතිපත්ති සමාලෝචනයේ දී, First Capital පර්යේෂණ අපේක්ෂාවන්ට අනුකූල ව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය OverNight ප්‍රතිපත්ති අනුපාතය (OPR) 7.75% මට්ටමේ පවත්වා ගැනීමට තීරණය කෙරිණි.

ශ්‍රී ලංකා රජය විසින් සීමිත ප්‍රාග්ධන වියදම් සමඟ පාරිභෝගික වියදම් සීමා කරමින් පැනවූ ඉහළ බදු සැලකිල්ලට ගනිමින්, 2025 දෙවන භාගය වන විට ආර්ථික වර්ධනය ලිහිල් විය හැකි බව අපි විශ්වාස කළෙමු. එපමණක් නොව, 2025 ජූලි වන විට 9.01x පමණ වන M2b මුදල් ගුණකයේ මන්දගාමී ප්‍රසාරණයෙන් ද වර්ධනය ලිහිල් වීම දැකිය හැකි විය. තවද, 2026 වසර දක්වාමන්දගාමී බව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඇමරිකා එක්සත් ජනපදය බොහෝ රටවලට සැලකිය යුතු තීරු බදු පැනවීමත් සමඟ, එය වියදම් අවම කර 2026 වසරේ දී වර්ධනය සීමා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එබැවින්, ඉහත කරුණු සලකා බැලීමේ දී, 2025 නොවැම්බර් ප්‍රතිපත්ති සමාලෝචනයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව OPR තවදුරටත් 25bps කින් ලිහිල් කිරීමට බලාපොරොත්තු විය හැකි බව අපි විශ්වාස කරමු. කෙසේ වෙතත්, ඉදිරි මාස 12 තුළ අඩු කළ අනුපාත අඛණ්ඩ ව පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඉහළ යන අනුපාත සඳහා සීමිත පීඩනයක් එල්ල වේ.

නිර්දේශය නිවැරදි ව ක්‍රියාත්මක කර

රැගෙන යාමේ මට්ටමක් පවත්වා ගන්න

නිර්දේශ :

“ඉදිරි මාස 6-12 ක කාලය තුළ ප්‍රතිලාභ ස්ථාවර ව පවතිනු ඇත.”

- ප්‍රතිලාභ දැනට අපගේ නිර්දේශිත කලාප තුළ පවතින අතර, ප්‍රතිලාභ වක්‍රය දැනට අපගේ නිර්දේශිත කලාප තුළ රැඳී පවතින අතර, දේශීය බැංකු විසින් අදාළ ද්‍රවශීලතා අගයන් ඉහළ නැංවීම සඳහා g-sec උපකරණ විකිණීම මධ්‍යයේ සුළු ඉහළ යාමක් පෙන්නුම් කරයි. මෙම වර්ධනය මධ්‍යයේ ප්‍රතිලාභ, දැනට අපගේ කලාප තුළ වසර 1 ක වෙළෙඳ අගය 8.05% ක් වන අතර, වසර 5 ක සහ වසර 10 ක වෙළෙඳ අගය පිළිවෙලින් 9.80% සහ 10.80% ක් වේ.
- 2025 නොවැම්බර සමාලෝචනය සඳහා කාඩ්පත් ආශ්‍රිතව තවත් 25bps ක අනුපාත කප්පාදුවක්: දළ දේශීය නිෂ්පාදිතයේ 4.9% ක ධනාත්මක වසරින් වසර වර්ධනයක් තිබිය දීත්, ඉදිරි මිලියන 12 ක වර්ධනීය කාලය සඳහා පුරෝකථනය කරන ලද ආර්ථික වර්ධනය, තීරු බදු හේතුවෙන් අපනයන මන්දගාමී වීම, ප්‍රාග්ධන වියදම් සඳහා රජය විසින් සාමාන්‍ය මට්ටමට වඩා අඩුවෙන් වියදම් කිරීම සහ ඉහළ බදු වලින් බර වූ පාරිභෝගික වර්ධනය හේතුවෙන් ඇති වන ගෝලීය වර්ධනය අඩු වීම ආදිය හේතුවෙන් මන්දගාමී ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින්, 2025 නොවැම්බර් ප්‍රතිපත්ති සමාලෝචනයේ දී OPR පවතින 7.75% සිට 7.50% දක්වා අඩු කිරීම සඳහා තවත් 25bps අනුපාත කප්පාදුවක් සඳහා ඉඩක් ඇති බව අපි විශ්වාස කරමු.
- ද්‍රවශීලතාවය ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. පොලී අනුපාත මත පීඩනය අඩු කරයි. වාහන ආනයනයෙන් ඇතිවන ඉල්ලුම ලිහිල් කිරීම සහ ඉන් පසුව ණයවල සුළු මන්දගාමී වීමක් අපේක්ෂා කෙරේ. ඉදිරි මාස 12 තුළ බැංකු පද්ධතියේ ද්‍රවශීලතාව රුපියල් බිලියන 150-200 අතර පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. එපමණක් නොව, බදු එකතු කිරීම වැඩි වීම සහ ප්‍රාථමික අතිරික්තයක් ඇති කිරීමට අපේක්ෂාවෙන් වියදම් අඩු කිරීම කෙටි කාලීන ව ද්‍රවශීලතාව මත පීඩනය මුදා හරිනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- කෙටි කාලීනව ස්ථාවරත්වය හා නිර්දේශය පවත්වා ගැනීම: ඉදිරි මාස 12 තුළ ප්‍රතිලාභ වක්‍රය ස්ථාවරව සහ අපගේ නිර්දේශිත කලාප තුළ පවතිනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, ආයෝජකයින්ට කෙටි කාලීන ව රැඳී සිටීමට, ප්‍රාග්ධන අලාභය අඩු කර ගැනීමට සහ කල් පිරෙන තෙක් රඳවා තබා ගැනීමෙන් පොලී ආදායමක් උපයා ගැනීමට හැකි බවට අප නිකුත් කළ අපගේ නිර්දේශය අපි දිගටම පවත්වා ගනිමු.

2025 දෙසැම්බර් සහ 2026 ජූනි සඳහා බැඳුම්කර ප්‍රතිලාභ අපේක්ෂාවන් : පීඩනය ක්‍රමයෙන් වර්ධනය වන විට ප්‍රතිලාභ ස්ථාවරව පවතී

2025 නොවැම්බර් ප්‍රතිපත්ති සමාලෝචනයේ දී 25bps අනුපාත කප්පාදුවක් සඳහා First Capital පර්යේෂණ අංශය ප්‍රක්ෂේපණය කළ ද, දළ දේශීය නිෂ්පාදිතයේ ඇති විය හැකි මන්දගාමී බව වැඩි කිරීමට, 2025 දෙසැම්බර් සහ 2026 ජූනි කාලය තුළ ප්‍රතිලාභ වක්‍රය ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. දළ දේශීය නිෂ්පාදිතයේ මන්දගාමී ප්‍රකෘතිය මධ්‍යයේ ණය සඳහා අඛණ්ඩ ඉල්ලුම වෙළෙඳපොළේ ද්‍රවශීලතාව අඩු කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ප්‍රධාන ආර්ථික දර්ශකවල අපේක්ෂිත ප්‍රමාණයට වඩා මන්දගාමී ප්‍රකෘතිමත් වීමක් සහ 2026 සහ 2027 වසරවල ණය කල්පිරීම් වැඩි වීම ප්‍රතිලාභ වක්‍රයේ තවදුරටත් පහළ යාම සීමා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 දෙසැම්බර් සහ 2026 ජූනි කාලය අතර ප්‍රතිලාභ වක්‍රය ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.



ඉදිරි මාස 12 තුළ පොලී අනුපාත ස්ථාවරව පවතිනු ඇත.



Source: First Capital Research

Disclaimer

This Review is prepared and issued by First Capital Holdings PLC based on information in the public domain, internally developed and other sources, believed to be correct. Although all reasonable care has been taken to ensure the contents of the review are accurate, First Capital Holdings PLC and/or its Directors, employees, are not responsible for the accuracy, usefulness, reliability of same. First Capital Holdings PLC may act as a Broker in the investments which are the subject of this document or related investments and may have acted on or used the information contained in this document, or the research or analysis on which it is based, before its publication. First Capital Holdings PLC and/or its principal, their respective Directors, or Employees may also have a position or be otherwise interested in the investments referred to in this document. This is not an offer to sell or buy the investments referred to in this document. This Review may contain data which are inaccurate and unreliable. You hereby waive irrevocably any rights or remedies in law or equity you have or may have against First Capital Holdings PLC with respect to the Review and agree to indemnify and hold First Capital Holdings PLC and/or its principal, their respective directors and employees harmless to the fullest extent allowed by law regarding all matters related to your use of this Review. No part of this document may be reproduced, distributed or published in whole or in part by any means to any other person for any purpose without prior permission.

ස්තුතියි !

"සාර්ථක ආයෝජනයක් යනු අවදානම් කළමනාකරණය කිරීමයි."

First Capital
A Janashakthi Group Company

අප අමතන්න

First Capital හෝල්ඩින්ග්ස් පීඑල්සී
නො: 02, ඩීල් ලෙදෙස,
කොළඹ 00300,
ශ්‍රී ලංකාව.
ඊ මේල් : research@firstcapital.lk

දිමන්ත මැතිව්
ප්‍රධාන පර්යේෂණ සහ උපාය මාර්ග නිලධාරී
T: +94 11 2639 853
E: dimantha@firstcapital.lk

රංජන් රණතුංග
සහකාර නියෝජ්‍ය සභාපති– පර්යේෂණ
T: +94 11 2639 863
E: ranjan@firstcapital.lk

ෂහානා කනගරත්නම්
ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය කළමනාකරු – පර්යේෂණ
T: +94 11 2639 866
E: shahana@firstcapital.lk

අක්නා තෙන්නකෝන්
ජ්‍යෝෂ්ඨ පර්යේෂණ විශ්ලේෂක
T: +94 11 2639 866
E: akna@firstcapital.lk

දිල්හාරි ඩයස්
පර්යේෂණ විශ්ලේෂක
T: +94 11 2639 866
E: dilhari@firstcapital.lk

මනුෂ කඳනාරච්චි
පර්යේෂණ සහකරු
T: +94 11 2639 866
E: manusha@firstcapital.lk

සලාමා සනූන්
පර්යේෂණ සහකරු
T: +94 11 2639 866
E: salaama@firstcapital.lk